සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2024 ජූලි

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate & Personal Taxation)

2024-08-11
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 08
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. සෑම ප්‍රශ්නයකම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ඔබට පහත දැක්වෙන තොරතුරු දී තිබේ:

(1) **රවී,** ඉන්දීය පුරවැසියෙකි. ඔහු 2022 මැයි 01 සිට 2024 අප්‍රේල් 30 දින දක්වා ශ්‍රී ලාංකික නැවක සේවයේ යෙදී සිටියි.

(2) **අමර,** ශ්‍රී ලංකාවේදී උපත ලැබූ අතර, 2023 ජනවාරි මාසයේදී රැකියාවක් සඳහා ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය විය. ඔහු ශ්‍රී ලංකාවේ තිබෙන නිවසකින් කුළී ආදායමක් උපයනු ලැබේ.

(3) **සරා,** එක්සත් රාජධානියේ පුරවැසියෙකු වන අතර, ශ්‍රී ලංකාවේ එක්සත් රාජධානි මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරිනියක වශයෙන් 2023 මාර්තු 15 දින සිට වසර තුනක කාලයක් සඳහා පත්කර තිබේ. කොළඹ පිහිටි තට්ටු නිවාසයක් ඇයට සපයා තිබෙන අතර, රාජකාරි භාරගැනීමෙන් පසු ඇය ශ්‍රී ලංකාවෙන් පිටව ගොස් නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, 2023/24 තක්සේරු වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා ඉහත පුද්ගලයින්ගේ වාසිකභාවය **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**හෙළ රස** දේශීය වෙළෙඳපොළ සඳහා රසකැවිලි නිෂ්පාදනය කරන අතර, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද [Social Security Contribution Levy (SSCL)] සඳහා ලියාපදිංචි වී සිටී. **හෙළ රස** හි 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පිරිවැටුම රු.35,000,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2022 අංක 25 දරණ සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) පනත යටතේ බද්දට යටත් වන තැනැත්තන් දෙදෙනෙකු(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(b) ඉහත කාර්තුව සඳහා **හෙළ රස** විසින් ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) **ගණනය කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

හොරණ ප්‍රසිද්ධ පාසැලක් අසල පිහිටි අක්කර 2 ක ඉඩමක් විකිණීම සඳහා වූ දැන්වීමක් **සරත්** දුටුවේය. ඔහු රු. මිලියන 16 කට ඉඩම මිලදී ගැනීම සඳහා ඉඩම් හිමියා වූ **සොයිසා** සමඟ ගිවිසුමකට එළඹුණු අතර, රු. මිලියන එකක අත්තිකාරමක් ගෙව්වේය. ඔහු ගනුදෙනුව මාස 6 ක කාලයක් තුළ පියවීමට එකඟ විය. ඉන් අනතුරුව ඔහු ඉඩම පර්චස් 15 කැබලිවලට වෙන් කළේය. ඉන්පසු එක් කැබැල්ලක් **සොයිසාට** නැවත ලබාදුන් අතර, තවත් කැබැල්ලක් තමාට තබා ගත්තේය. ඉතිරිය පොදු ජනයා අතර, විකුණා දැමීය. **සරත්** ඉතිරි රු. මිලියන 15 **සොයිසාට** ගෙවූ අතර, මෙම සම්පූර්ණ ගනුදෙනුවෙන් ලාභයක් ඔහු උපයන ලදී. මෙම ගනුදෙනුව මත ආදායම් බදු සඳහා වන බලපෑම ඔහුට දැනගැනීමට අවශ්‍ය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සරත්** විසින් උපයන ලද ලාභය, ආදායම් බදු සඳහා යටත් වන්නේදැයි *"රාම් ඊස්වර එදිරිව දේශීය ආදායම් කොමසාරිස්"* නඩු තීන්දුව පදනම් කරගනිමින් **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

(a) වෘත්තියෙන් නීතිඥයෙකු වන **ඩේමියන්** සිය පවුල සමඟ කැනඩාවට සංක්‍රමණය වීමට සැලසුම් කරයි. එමනිසා ඔහු 2023/24 තක්සේරු වර්ෂය තුළදී පහත සඳහන් ප්‍රාග්ධන ස්වරූපයේ ගනුදෙනු සිදුකර ඇත:

| වත්කම් වර්ගය | පිරිවැය (රු.) | 2017.09.30 දිනට වෙළෙඳපොළ අගය (රු.) | ලද ප්‍රතිෂ්ඨාව (රු.) |
|---|---|---|---|
| ඉදිකර ඇති 2014 වර්ෂයේ සිට භාවිතයට ගත් පදිංචි නිවස | 9,500,000 | 13,200,000 | 16,000,000 |
| 2012 වර්ෂයේ සිට ඔහුගේ ව්‍යාපාරයට භාවිත කළ කාර්යාල ගොඩනැගිල්ල | 10,500,000 | 12,500,000 | 13,000,000 |
| 2014 මිලට ගෙන **සීමාසහිත ABC සමාගමට** කුලියට දුන් ගොඩනැගිල්ල | 18,000,000 | 22,500,000 | 26,800,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගනුදෙනු මත, **ඩේමියන්** විසින් ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බද්ද [Capital Gain Tax (CGT)] **ගණනය කරන්න.** (ලකුණු 03)

(b) **සීමාසහිත සතාරා (පෞද්ගලික) සමාගම**, 2023 දෙසැම්බර් 31 දින රු.150,000,000/- ක දළ ලාභාංශයක් එහි කොටස්හිමියන්ට ප්‍රකාශයට පත්කළ අතර, 2024 ජනවාරි මාසයේදී එය ගෙවන ලදී. මෙම ලාභාංශය 2022/23 තක්සේරු වර්ෂයේ ලාභයෙන් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගෙවන ලද ලාභාංශය මත, අඩුකළ යුතු අත්තිකාරම් ආදායම් බද්ද [Advance Income Tax (AIT)] **ගණනය කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස
(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

**"රත් සළු"** එකතු කළ අගය මත බද්ද [Valued Added Tax (VAT)] සඳහා ලියාපදිංචි පුද්ගලයෙකු වන අතර, රෙදිපිළි මිලදීගෙන දේශීය වෙළෙඳපොළේ විකිණීමේ නිරතව සිටියි. පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා සමාගමේ ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුවේ ආදායම් විස්තර (VAT රහිතව) පහත දැක්වේ:

| | රු. |
|---|---|
| දේශීයව නිෂ්පාදනය කරන ලද අත් යන්ත්‍ර (handloom) රෙදිපිළි විකිණීමෙන් | 3,786,000 |
| ආනයනය කළ රෙදිපිළි විකිණීමෙන් | 27,764,000 |

(2) සමාගම විසින් කාර්තුව තුළදී පහත සඳහන් යෙදවුම් බදු (input tax) ගෙවා තිබේ:

| | රු. |
|---|---|
| ආනයනය කළ රෙදිපිළි මත | 1,325,000 |
| දේශීයව නිපදවූ අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රවාහනය සඳහා | 234,000 |
| ප්‍රධාන විධායක නිලධාරීවරයා භාවිත කරන මෝටර් රථයේ නඩත්තු වියදම් මත | 14,500 |
| කාර්යාල වියදම් මත | 464,000 |

(3) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන ආ වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.36,000/- ක් විය.

(4) එකතු කළ අගය මත මාසික බදු වාරික වශයෙන් රු.2,000,000/- ක් ව්‍යාපාරය විසින් ගෙවා තිබේ.

*(එකතු කළ අගය මත සම්මත බදු අනුපාතය 18% ක් ලෙස සළකන්න.)*

**ඔබ විසින් කළ යුතු දෑ:**

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

### 06 වන ප්‍රශ්නය

**කේක් ෆැක්ටරි** යනු හෝටල් පාසලක ශිෂ්‍යාවන් වන **රාධා** සහ **ධාරා** යන මිතුරියන් විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුහු ව්‍යාපාරයේ ලාභා'ලාභ සම සමව බෙදා ගැනීමට එකඟ වී සිටිති.

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලින් පහත සඳහන් තොරතුරු උපුටාගෙන තිබේ:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.8,450,000/- කි.

(2) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ:

- වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ වැටුප්:

| | රු. |
|---|---|
| **රාධා** | 1,200,000 |
| **ධාරා** | 1,800,000 |

- **රාධාගේ** සොහොයුරිය විසින් පොත් තැබීමේ කටයුතු සිදුකරන අතර, මාසිකව රු.25,000/- ක වැටුපක් ඇයට ගෙවා තිබේ.

- **රාධා** හවුල් ව්‍යාපාරයට ණය මුදලක් ලබා දී තිබෙන අතර, රු.38,000/- ක පොලියක් **රාධා ට** ගෙවා තිබේ.
- කාර්යාල පරිශ්‍රය **ධාරා** ට අයත් අතර, මාසිකව රු.50,000/- ක කුලියක් ඇයට ගෙවා තිබේ.
- කොළඹ ජාතික රෝහලට පරිත්‍යාගයක් වශයෙන් රු.100,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ගෙවිය යුතු ආදායම් බද්ද **තක්සේරු කරන්න.** (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**සීමාසහිත Blue Sky සමාගම,** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගමකි. සමාගම, 2022/23 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ආදායම් වාර්තාව (return of income) ඉදිරිපත් කර නොමැත. සහකාර කොමසාරිස්වරයා ඔහුගේ විනිශ්චය මත පිහිටා 2024 ජනවාරි 05 දින පැහැර හරින ලද තක්සේරුවක් නිකුත් කර තිබේ.

**සීමාසහිත Blue Sky සමාගමේ** අධ්‍යක්ෂවරියක වන **ෂෙනිලා,** වාසික පුද්ගලයෙකු වන අතර, ඇය නොදැනුවත්ව 2022/23 තක්සේරු වර්ෂය සඳහා රු.82,000/- ක පුද්ගල ආදායම් බද්දක් (individual income tax) වැඩිපුර ගෙවා ආදායම් වාර්තාව නියමිත දිනට ගොනුකර තිබේ.

ඔබ, **සීමාසහිත Blue Sky සමාගමේ** බදු උපදේශකවරයාය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2022/23 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ගොනු කිරීමට නියමිත දිනය **සඳහන් කරන්න.** (ලකුණු 02)

(b) පරිපාලන සමාලෝචනය සඳහා ඉල්ලීමක් කිරීමේදී (තක්සේරුවකට එරෙහි වලංගු අභියාචනයක් කිරීමේදී) **සීමාසහිත Blue Sky සමාගම** විසින් ඉටු කළ යුතු කොන්දේසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(c) දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව, වැඩිපුර ගෙවූ ආදායම් බදු ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට **ෂෙනිලා** ට හිමිකම් ඇත්දැයි **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත සුව සාරා (පෞද්ගලික) සමාගම,** ශ්‍රී ලංකාවේ වාසික සමාගමකි. එය අපනයන වෙළෙඳපොළ සඳහා ඖෂධීය නිෂ්පාදන විශාල ප්‍රමාණයෙන් නිෂ්පාදනය කරයි. **සීමාසහිත සුව සාරා (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් තොරතුරු 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයට අදාළ වේ:

(1) 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත සුව සාරා (පෞද්ගලික) සමාගමේ** සාරාංශගත ආදායම් ප්‍රකාශය පහත දැක්වේ:

| | රු. |
|---|---|
| අපනයන විකුණුම් | 1,654,000,000 |
| විකුණුම් පිරිවැය | (892,000,000) |
| **දළ ලාභය** | **762,000,000** |
| වෙනත් ආදායම් | 1,448,000 |
| පරිපාලන හා බෙදාහැරීමේ වියදම් | (386,500,000) |
| මූල්‍ය වියදම් | (4,800,000) |
| **ශුද්ධ ලාභය** | **372,148,000** |

(2) වෙනත් ආදායම්වල සංයුතිය:

| | රු. |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය | 38,000 |
| ස්ථාවර තැන්පතු මත පොළී ආදායම (දළ) | 260,000 |
| ලාභාංශ ආදායම - ලැබුණු ලාභාංශවලින් | 1,150,000 |
| | **1,448,000** |

(3) පරිපාලන සහ බෙදාහැරීමේ වියදම්වල පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- වර්ෂය සඳහා ක්ෂය රු.44,680,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදනය රු.26,732,000/- කි.
- වර්ෂය තුළදී අපේක්ෂිත ගැනුම්කරුවෙක් නිෂ්පාදන ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සඳහා ප්‍රංශයේ සිට පැමිණි අතර, සමාගම ඔහුගේ සංග්‍රහ වියදම් වශයෙන් රු.450,000/- ක් දරා තිබේ.
- සමාගම, රු.1,000,000/- ක් වටිනා ඖෂධීය නිෂ්පාදන ආයුර්වේද දෙපාර්තමේන්තුවට පරිත්‍යාග කර තිබේ. තවද, රු.200,000/- ක මුදලක් සමාගමේ පැරණි සේවකයෙකුට ඔහුගේ හෘද සැත්කම සඳහා පරිත්‍යාග කර තිබේ.

(4) කාලීන ණය මත ගෙවූ රු.4,800,000/- ක පොලිය, මූල්‍ය වියදම්වල ඇතුළත් වේ.

(5) 2024 මාර්තු 31 දිනට ස්කන්ධය සහ වගකීම් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය | 8,000,000 |
| රඳවාගත් ඉපැයීම් | 1,450,000 |
| ස්කන්ධය | 9,450,000 |
| ගෙවිය යුතු ණය | 40,000,000 |

(6) 2024 මාර්තු 31 දිනට දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

| වත්කම් | මිලට ගත් දිනය | අත්පත් කර ගැනීමේ පිරිවැය (රු.) |
|---|---|---|
| ඉඩම | 2016/17 | 120,000,000 |
| ගොඩනැගිලි | 2016/17 | 84,000,000 |
| මෝටර් ලොරි රථ | 2020/21 | 65,000,000 |
| පිරියත හා යන්ත්‍ර | 2016/17 | 96,000,000 |
| පිරියත හා යන්ත්‍ර | 2023/24 | 145,000,000 |
| කාර්යාල උපකරණ | 2021/22 | 1,759,000 |
| පරිගණක | 2022/23 | 2,435,000 |
| පරිගණක මෘදුකාංග | 2023/24 | 1,200,000 |
| | | **515,394,000** |

- 2018/19 තක්සේරු වර්ෂයේදී රු.22,550,000/- කට මිලට ගත් යන්ත්‍රයක් 2023 දෙසැම්බර් මාසයේදී රු.3,000,000/- කට විකුණන ලදී.
- පරිගණක මෘදුකාංගවල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 4 කි.

(7) ඉවත් වූ සේවකයෙකුට රු.500,000/- ක පාරිතෝෂිකයක් ගෙවන ලදී.

(8) සමාගම, 2023/24 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.50,000,000/- ක් ගෙවා තිබේ.

(9) ස්ථාවර තැන්පතු පොළී ආදායම මත, අත්තිකාරම් ආදායම් බද්ද [Advance Income Tax (AIT)] / රඳවාගැනීමේ බද්ද [Withholding Tax (WHT)] වශයෙන් බැංකුව විසින් රු.13,000/- ක් අඩුකරගෙන තිබේ.

**ඔබ විසින් කල යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා **සීමාසහිත සුව සාරා (පෞද්ගලික) සමාගමේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) තක්සේරු කල හැකි ආදායම,

(b) බදු අයකල හැකි ආදායම,

(c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ

(d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද / (වැඩිපුර ගෙවූ බද්ද).

***(සැ.යු: යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කල යුතුයි.)*** (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

වාසික පුද්ගලයෙකු වන **දිමුතු,** සීමාසහිත **සිටි ලංකා පොදු සමාගමෙහි** ජ්‍යෙෂ්ඨ බදු කළමනාකරුවෙකු ලෙස සේවය කරයි.

2023/24 තක්සේරු වර්ෂයට (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) අදාලව **දිමුතුගේ** ආදායම සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) **සේවා නියුක්තියෙන් ලද ආදායම:**

- සීමාසහිත **සිටි ලංකා පොදු සමාගමෙන්** ලැබුණු දළ වැටුප මාසිකව රු.260,000/- බැගින් විය.
- සමාගම, ඉන්ධන සමග මෝටර් රථයක් ඔහුට ලබාදී ඇති අතර, භාවිතය සඳහා ධාවන වාර්තා පවත්වා නොගනී.
- බම්බලපිටියේ ඔහුගේ කාර්යාලය ආසන්නයේ පිහිටි කුලී නිවසක ඔහු වාසය කරයි. නිවසේ මාසික කුළිය රු.60,000/- ක් වන අතර එය ඔහු විසින් දරණු ලබයි. වාසස්ථානය සඳහා දීමනාවක් (allowance) වශයෙන් මාසිකව රු.80,000/- ක් සමාගමෙන් ඔහුට ලැබේ.
- සමාගම ඔහුගේ ජංගම දුරකතන බිල්පත් දරණ අතර, වර්ෂය තුළදී රු.85,000/- ක් වූ ඔහුගේ දුරකතන බිල්පත් සඳහා ප්‍රතිපූරණය කර තිබේ.
- සමාගම විසින් සියලුම සේවකයින් සඳහා වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් සපයා තිබේ. වර්ෂය තුළදී සමාගම විසින් **දිමුතු** වෙනුවෙන් රු.60,000/- ක් ගෙවා තිබේ.
- වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු [Advance Personal Income Tax (APIT)] වශයෙන් රු.204,600/- ක් අඩුකර තිබේ.

(2) **දිමුතු** තනි පුද්ගල සේවාදායකයින්ට බදු උපදේශන සේවා සැපයීම සඳහා ඔහුගේම බදු උපදේශන සේවා ආයතනයක් පවත්වාගෙන යයි. 2023/24 වර්ෂය සඳහා ඔහුගේ ව්‍යාපාරයේ ආදායම් සහ වියදම් විස්තර පහත දැක්වේ:

| **විස්තරය** | රු. | රු. |
|---|---|---|
| උපදේශන සේවා ආදායම | | 4,800,000 |
| **අඩු කලා : ගෙවීම්** | | |
| පුහුණුවන්නන් සඳහා වැටුප් | 540,000 | |
| බදු උපදෙස් ලබා ගැනීම වෙනුවෙන් පිටස්තර උපදේශකවරුන්ට ගෙවූ වෘත්තිය ගාස්තු | 750,000 | |
| ත්‍යාග | 820,000 | |
| කුළිය (ඔහුගේ වාසස්ථානය වෙනුවෙන් රු.720,000/- අදාළ වේ) | 960,000 | |
| ක්ෂය - ගෘහ භාණ්ඩ | 65,000 | (3,135,000) |
| **ශුද්ධ ලාභය** | | **1,665,000** |

- රු.650,000/- ක පිරිවැයකට 2019/20 දී අත්පත් කරගත් ගෘහ භාණ්ඩ සඳහා ක්ෂය අයකර තිබේ.
- පොළොන්නරුව මහ රෝහලට පරිත්‍යාග කළ රු.540,000/- ක් ත්‍යාග තුළ ඇතුළත් වේ. අනෙකුත් ත්‍යාග, නව වසර සඳහා සේවාදායකයින් ලබාදුන් ඒවා වේ.

(3) **දිමුතුගේ** නිවස, කුරුණෑගල පිහිටා ඇති අතර, එය මාසිකව රු.60,000/- ක කුලියට සමාගමකට දී තිබේ. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.250,000/- ක් වන අතර, 20% බැගින් වරිපනම් **දිමුතු** විසින් ගෙවා තිබේ.

(4) වර්ෂය තුළදී, පහත සඳහන් පොලී ආදායම් **දිමුතු** ට ලැබී තිබේ:

| **විස්තරය** | **ලැබුණු දිනය** | **මුදල (දළ)(රු.)** | **අඩුකළ අත්තිකාරම් ආදායම් බදු / රඳවාගැනීමේ බදු (AIT/ WHT) (රු.)** |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු මත පොළිය (FD) | 31.12.2023 | 1,300,000 | 65,000 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලිය | 20.01.2024 | 600,000 | - |

(5) වර්ෂය තුළදී, ආයෝජනවලින් පහත ආදායම් **දිමුතු** ට ලැබී තිබේ:

- නිල ලැයිස්තුගත සමාගමක කොටස් විකිණීමෙන් ලද ලාභය:

| **සමාගම** | **පිරිවැය (රු.)** | **විකිණීමෙන් ලැබුණු මුදල (රු.)** | **ලාභය / (අලාභය) (රු.)** |
|---|---|---|---|
| සීමාසහිත රන් සිහින පොදු සමාගම | 945,000 | 1,200,000 | 255,000 |

- නිල ලැයිස්තුගත පොදු සමාගම්වලින් ලැබුණු ලාභාංශ (ශුද්ධ) ආදායම රු.799,000/- ක් වන අතර, අදාළ AIT / WHT ලාභාංශ ආදායමෙන් අඩුකර තිබේ.

(6) ඔහු, 2023/24 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය ආදායම් බදු වාරික වශයෙන් රු.1,000,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2023/24 තක්සේරු වර්ෂය සඳහා **දිමුතුගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) ආදායම් බද්ද, සහ

(d) බදු නිදහස් ආදායම, (වේ නම්).

***(සැ.යු:** යම් ආදායමක් බද්දට යටත් නොවේ නම්, ඒ බව පැහැදිලිව සඳහන් කළ යුතුයි.)* (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුල දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |